**ශීර්ෂය 145 - බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 145 - බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 19 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 17,925.58 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 14,622.93 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු.මිලියන 3,302.65 ක් හෙවත් සියයට 18.42 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 955.09 | 932.77 | 22.32 | 2.34 |
| මූලධන | 16,970.49 | 13,690.16 | 3,280.33 | 19.33 |
| **එකතුව** | **17,925.58** | **14,622.93** | **3,302.65** | **18.42** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 14501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 6.00 | 5.99 | 4.00 | 4.22 | 37.00 | 11.46 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් දෙකක ශේෂ එකතුව රු.මිලියන 14.87 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0015/0056/000 | 0.04 |
| 6000/0000/00/0016/0055/000 | 14.83 |
| **එකතුව** | **14.87** |

**2.4 විගණන නිරීක්ෂණය**

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, අමාත්‍යාංශය විසින් ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

**3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

**-----------------------------------------**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 02 කට 2017 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.මිලියන 6,876.88 ක් විය.

**3.3 විසර්ජන ගිණුම**

**-----------------**

**අයවැය විචලනය**

**-------------------**

වැය විෂයයන් 10 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සියයට 15 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**-------------------------------------------**

**3.4.1 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**-------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු භාණ්ඩ ඒකක 156 ක අතිරික්තතා හා භාණ්ඩ ඒකක 120 ක ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103, 104, 105 හා 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සමීක්ෂණ මණ්ඩලය විසින් භාවිතා කළ නොහැකි භාණ්ඩ ඒකක 11 ක් සම්බන්ධයෙන් නිර්දේශ ලබා දී නොතිබුණු අතර භාණ්ඩ ඒකක 95 ක් විකිණීමටත් භාණ්ඩ ඒකක 42 ක් විනාශ කිරීමටත් භාණ්ඩ ඒකක 02 ක් අළුත්වැඩියා කිරීමටත් නිර්දේශ කර තිබුණද අමාත්‍යාංශය විසින් 2017 ජූලි 31 දින වන විටත් එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.4.2 බේරුම් නොකළ බැරකම්**

**---------------------------**

අමාත්‍යාංශය විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.119,084,228 ක් විය.

**3.5 අනුකූල නොවීම්**

**------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 94(1) | 1,352,640 | වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) XV පරිච්ඡේදයේ 3.1 වගන්තිය | 469,369 | ස්වකීය පත්වීම් කොන්දේසි අනුව සේවයේ ස්ථිර කරනු ලැබීම පිණිස ලබාගත යුතු කිසියම් සුදුසුකමක් ලබාගැනීම සඳහා මිස පරිවාස කාලයේ සිටින නිලධාරියෙකු අධ්‍යයනය හෝ අභ්‍යාසය සඳහා පිටරට නොයැවිය යුතු වුවද, අමාත්‍යාංශයේ පරිවාස කාලය තුළ සිටින නිලධාරීන් තිදෙනෙකු ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට පටහැනිව අවස්ථා 04 කදී විදේශ පුහුණු සඳහා සහභාගී කර ඒ සඳහා වියදම් කර තිබුණි. |
| (ii) XXIV පරිච්ඡේදයේ 10.4 වගන්තිය | 146,545 | වර්ෂ 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නොතිබුණු නිලධාරියෙකුට ඇපකරුවන් නොමැතිව ආපදා ණය ගෙවා තිබුණි. |
| (ඇ) ජාතික අයවැය චක්‍රලේඛ | | |
| 2015 මාර්තු 31 දිනැති අංක 02/2015 දරන චක්‍රලේඛය | 1,564,097 | ප්‍රචාරණ කටයුතු සඳහා රජයේ අරමුදල් භාවිතා නොකළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2016 වර්ෂයේ අවස්ථා 12 කදී විවිධ සැමරුම් පිළිබඳ දැන්වීම් පළ කිරීම සඳහා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. |

**3.6 විදේශාධාර ව්‍යාපෘති**

**----------------------**

**විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය**

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉන්දියානු රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන නිවාස ව්‍යාපෘතියක් සඳහා 2015 හා 2016 වර්ෂවලදී සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු.මිලියන 6,492 ක් වුවත්, අදාළ මුදල් සෘජුවම ශ්‍රී ලංකා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය වෙත ලබාදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණු බැවින් වියදම ගිණුම් ගතවී නොතිබුණි. අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය පිළිබඳ ඇගයීමක් සිදු කර නොතිබුණු අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල 07 කින් ලැබී තිබුණු භෞතික කාර්යසාධන වාර්තා අනුව එකක් රු.550,000 කින් ඉදිකළ යුතු නව නිවාස 46,000 කින් නිවාස 43,727 ක හා අළුත්වැඩියා කළ යුතු නිවාස 1,286 කින් නිවාස 1,282 ක පමණක් වැඩ අවසන් කර තිබුණි. සෙමින් ඉදිවන හා අත්හැර දමන ලද ප්‍රශ්ණ සහගත නිවාස 247 ක ඉදිකිරීම් කටයුතු 2016 ජුනි 08 දිනට ප්‍රථම සම්පූර්ණ නොකළහොත් එකී නිවාස සඳහා වැය නොකළ මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව ඉන්දියානු තානාපති කාර්යාලය විසින් දන්වා තිබුණු නමුත් ඒ පිළිබඳ අවධානය යොමුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රජය හා පකිස්ථානු රජය යටතේ ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘතිය මඟින් 2016 නොවැම්බර් 30 දිනට ඉදිකිරීම් අවසන් කළ යුතු නිවාස 230 ක් සඳහා එක් නිවසකට රු.550,000 බැගින් 2015 හා 2016 වර්ෂවලදී සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු.126,500,000 ක් විය. ඉන් නිවාස 73 ක පමණක් ඉදිකිරීම් අවසන් කර තිබුණු නමුත් අත්තිවාරම් මට්ටම, බිත්ති මට්ටම හා වහළ දොර හා ජනෙල් මට්ටමට පමණක් වැඩ අවසන්කර තිබුණු නිවාස 157 ක වැඩ අවසන් කිරීම සඳහා මුළු ප්‍රතිපාදනයෙන් සියයට 09 ක් වන රු.11,000,000 ක ප්‍රතිපාදන පමණක් ඉතිරි වී තිබුණි. මෙම ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය පිළිබඳ ඇගයීමක් සිදුකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රජය හා බහරේන් රජය යටතේ ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘතිය මගින් ඉදිකළ යුතු නව නිවාස 260 ක් සඳහා එක් නිවසකට රු.550,000 බැගින් 2015 හා 2016 වර්ෂවලදී සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු.143,000,000 ක් විය. ඉන් නිවාස 120 ක පමණක් ඉදිරිකිරීම් සම්පූර්ණ කර තිබුණු නමුත් ආරම්භ නොකළ නිවාස 04 ක, අත්තිවාරම් මට්ටම දක්වා වැඩ අවසන්කර තිබුණු 01 නිවසක, බිත්ති මට්ටම දක්වා වැඩ අවසන් කර තිබුණු නිවාස 14 ක හා වහළ, දොර හා ජනෙල් මට්ටම දක්වා වැඩ අවසන් කර තිබුණු නිවාස 121 ක ඉදිකිරීම් සම්පූර්ණ කිරීම සඳහා මුළු ප්‍රතිපාදනයෙන් සියයට 9 ක් වන රු.13,025,000 ක ප්‍රතිපාදන පමණක් ඉතිරිව තිබුණි. මෙම ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය පිළිබඳ ඇගයීමක් සිදුකරද නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රජය හා කසකස්ථාන රජය යටතේ ක්‍රියාත්මක වන නිවාස ව්‍යාපෘතිය මගින් ඉදිකිරීම් අවසන් කළ යුතු නිවාස 47 ක් සඳහා එක් නිවසකට රු.550,000 බැගින් 2015 හා 2016 වර්ෂවලදී සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු.25,850,000 ක් විය. ඉන් නිවාස 30 ක ඉදිකිරීම් පමණක් අවසන් කර තිබුණු නමුත් බිත්ති මට්ටම දක්වා පමණක් ඉදිකිරීම් සම්පූර්ණ කර තිබුණු නිවාස 17 ක ඉදිකිරීම් සම්පූර්ණ කිරීම සඳහා මුළු ප්‍රතිපාදනයෙන් සියයට 2 ක් වන රු.550,000 ක ප්‍රතිපාදන පමණක් ඉතිරිවී තිබුණි. මෙම ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය පිළිබඳ ඇගයීමක් සිදුකරද නොතිබුණි.

## 3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-------------------------------

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන 7 ක් පවත්වා ගෙන යාම සඳහා වර්ග අඩි 35,000 ක ගොඩනැගිල්ලක් කුලියට ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු 2015 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. වර්ග අඩියක් සඳහා රු.39.93 ක ප්‍රථම අවම මිල සහිත වර්ග අඩි 35,000 ක ගොඩනැගිල්ල හෝ වර්ග අඩියක් සඳහා රු.140 ක දෙවන අවම මිල සහිත වර්ග අඩි 35,000 ක ගොඩනැගිල්ල හෝ කුලී පදනම මත ලබා ගැනීම සුදුසු බව තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණි. නමුත් එම නිර්දේශය නොසලකා වර්ග අඩියක් සඳහා රු.145 ක තෙවන අවම මිල සහිත වර්ග අඩි 35,100 ක ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගැනීමට මෙම ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි. නමුත් තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය නොසලකා හැරීමට හේතුවූ පිළිගත හැකි කරුණු කිසිවක් වාර්තා කර නොතිබුණි.

තවද, තෙවන අවම මිල සහිත ගොඩනැගිල්ල රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් වර්ග අඩියක් රු.85.70 බැගින් මාසික කුලිය රු.3,000,000 කට තක්සේරු කර තිබුණි. නමුත් එම තක්සේරුව සඳහා ගොඩනැගිලි අයිතිකරු එකගතාවය පළ කර නොතිබුණු බව පවසා වෙළඳපොල කුලී වටිනාකම අනුව තක්සේරුවක් ලබා දෙන මෙන් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2016 ජනවාරි 25 දින රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් කර තිබුණු ඉල්ලීමෙන් පසු වර්ග අඩියක් රු.120 බැගින් මාසික කුලිය රු.4,200,000 කට තක්සේරු කර තිබුණි. නමුත් රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ දෙවන තක්සේරුවද නොසලකා වර්ග අඩියක් රු.145 බැගින් වර්ග අඩි 35,100 ක් සඳහා මාසික කුලිය රු.5,089,500 ක් ගෙවීමේ පදනමින් 2016 මැයි 10 දින සිට 2018 මැයි 09 දින දක්වා වූ වර්ෂ 2 ක කාලයක් සඳහා ගොඩනැගිල්ල කුලියට ගැනීමේ බදු ගිවිසුම අත්සන් කර තිබුණි.

ඒ අනුව රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව ඉක්මවා මසකට රු.889,500 බැගින් 2016 මැයි 10 දින සිට 2017 අගෝස්තු 10 දින දක්වා වූ මාස 15 ක කාලයක් සඳහා රු.මිලියන 13.34 ක් හා ඒමත එකතු කළ අගය මත බදු වැඩිපුර ගෙවා තිබුණි.

## 3.8 අවිධිමත් ගනුදෙනු

------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) අමාත්‍ය මණ්ඩලයේ හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ හෝ විධිමත් අනුමැතියකින් තොරව යාපනය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක නිලධාරීන් 488 දෙනෙකු වෙත රු.5,552,700 ක විශේෂ දීමනා ගෙවා තිබුණි.

(ආ) දේශපාලන හේතූන් මත විවිධ ගැටළුවලට මුහුණ දුන් අයට සහන සැලසීම උදෙසා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් පිහිටුවා තිබුණු කමිටුවට සහායවීම සඳහා අමාත්‍යාංශය විසින් අනු කමිටුවක් පත්කර තිබුණි. එම අනු කමිටුවට සහායවීම සඳහා යැයි පවසමින් බාහිර පාර්ශවයක දෙදෙනෙකු පත්කර එක් අයෙකුට දිනකට රු.1,500 ක් බැගින් 2015 දෙසැම්බර් මාසයේ සිට 2016 දෙසැම්බර් මාසය දක්වා කාලය තුළදී රු.705,000 ක් ගෙවා තිබුණි.

## 3.9 කළමනාකරණ දුර්වලතා

සංවර්ධනය වෙමින් පවතින රටවල ව්‍යාපාර කළමනාකරණය සඳහා විදේශ පුහුණුව ලබා දීම සඳහා අමාත්‍යාංශයේ නිලධාරීන් 06 දෙනෙකු නම් කර එවන ලෙස විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා තිබුණි. නමුත් ඒ සඳහා නිලධාරීන් දෙදෙනෙකු පමණක් නම් කර යවා තිබීම නිසා ඉතිරි අවස්ථා අමාත්‍යාංශයේ නිලධාරීන්ට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 20 | 11 | 09 |
| (ii) | තෘතියික මට්ටම | 07 | 04 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 104 | 79 | 25 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 36 | 27 | 09 |
| | **එකතුව** | **167** | **121** | **46** |